**සුරාබදු තැගි අරමුදල - 2020**
**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**-----------------------------**

සුරාබදු තැගි අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1990 අංක 37 දරන සුරාබදු පනතින් සංශෝධිත 1912 අංක 08 දරන සුරාබදු අඥාපනතේ 58 "ඒ" වගන්තිය හා සුරාබදු අඥාපනතේ 32(2) (කිව) වගන්තිය යටතේ වූ අංක 818 සුරාබදු නිවේදනය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
-------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලන පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ට අනුකූල නොවන අයුරින් අරමුදලේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීමට අදාල ගිණුම් ප්‍රතිපත්තිය වෙනස් කර තිබුණි. | 2020 වර්ෂය සඳහා වත්කම් ක්ෂය නොකිරීමට ගත් ප්‍රතිපත්තිමය තීරණයක් හේතුවෙන් ක්ෂය නොකිරීමට කටයුතු කර ඇත. | පවත්නා ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කරන්නේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 17 (අ) සහ (ආ) විධිවිධාන අදාල කරගත යුතු වේ. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ)** මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු. 47,134,000 ක් ලෙස දක්වා තිබුණද, එය ගොඩනැගිල්ලේ වටිනාකම පමණක් විය. එසේ වුවද ගොඩනැගිල්ල පිහිටි ඉඩම සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබූ අතර ඉඩමේ අයිතිය සනාථ කිරීමට අවශ්‍ය ලියකියවිලි විගණනයට ඉදිරිපත් නොවුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 අනුව පිරිවැය රු. 47,134,100.00 ක් වූ ගොඩනැගිලි සඳහා උපදෙස් අනුව ක්ෂය ගණනය කිරීමට කටයුතු කරමි. ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් පවරා ගත් ඉඩම ප්‍රත්‍යාගණනය කිරීමෙන් අනතුරුව පොත්වලට ගැනීමට සටහන් කර ගන්නා ලදි. | ගොඩනැගිල්ල පිහිටි ඉඩම විධිමත් පරිදි අයිතිය තහවුරු කර ගනිමින් තක්සේරු කර ගිණුම්ගත කිරීම. |
| **(ආ)** සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම රු.47,134,000 ක් වූ ගොඩනැගිලි වෙනුවෙන් ක්‍ෂය ගැලපීම් සිදුකර නොතිබූ අතර, එකතුව රු. 25,259,100 ක් වූ අනෙකුත් ස්ථාවර වත්කම් සඳහා සමාලෝචිත වර්ෂයේ රු. 5,223,703 ක ක්ෂය ප්‍රතිපාදනයන් සලසා නොතිබුණි. | 2020 වර්ෂය සඳහා වත්කම් ක්ෂය නොකිරීමට ගත් ප්‍රතිපත්තිමය තීරණයක් හේතුවෙන් ක්ෂය නොකිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. මේ සම්බන්ධව අවසාන ගිණුම් වාර්තාවේ සටහන්වල 2.6 හි දක්වා ඇත. 2021 වර්ෂයේදී 2020 වර්ෂයට අදාළ ක්ෂය වෙන් කිරීම් සිදු කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 පරිදි කටයුතු කිරීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 17 (අ) I හා II ඡේද | ලැබෙන සිගරට් දඩ මුදලින් සියයට 25 ක කොටසකින් දුම්කොළ තැගි අරමුදලක් පිහිටුවීමට කටයුතු සිදු කළ යුතු වුවත් අරමුදලේ ආරම්භක දින සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම එවැනි අරමුදලක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | දුම්කොළ අරමුදලක් මෙතෙක් පිහිටුවා නොමැති අතර, ඉදිරියේදී පිහිටුවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී. | 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ විධිවිධාන ප්‍රකාරව දුම්කොළ තැගි අරමුදලක් පිහිටුවීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාලව අරමුදල සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා අදාල අංශ දැනුවත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු සිදුකිරීම. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| | (i) 11.1 ඡේදය, මුදල් රෙගුලාසි 756(6) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 72,393,100 ක් වූ ස්ථාවර වත්කම් වෙනුවෙන් සමීක්ෂණ සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට මේ සම්බන්ධ වාර්තා පිළියෙල කිරීමට කටයුතු කරමි. | -එම- |
| | (ii)15.3 ඡේදය, මුදල් රෙගුලාසි 877(2)(ඇ) | අරමුදලේ සමාලෝචිත වර්ෂයේ ප්‍රගතිය සමාලෝචනය කළ හැකි වන පරිදි අයවැය ඉලක්ක ළඟාවීම්, කාර්තුමය ප්‍රගතිය පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අදාල වාර්තා ලබාදීම සඳහා කටයුතු කරමි. | -එම- |
| | (iii) 15.3 ඡේදය, මුදල් රෙගුලාසි 877(2)(ඇ) | 2020 වර්ෂයේ සුරාබදු තැගි අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ අරමුදලේ කාර්ය සාධන වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට සුරාබදු තැගි අරමුදලේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය සමඟ අරමුදලේ කාර්යසාධන වාර්තාවන් ලබාදීම සඳහා කටයුතු කරමි. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 7,177,263 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 160,411,245 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 167,588,508 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමථ ගාස්තු ලැබීම් රු. 86,140,308. ක් හෙවත් සියයට 36 කින් අඩුවීමට වඩා තැගි මුදල් ගෙවීම් රු. 247,663,593 ක් හෙවත් සියයට 63 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2** සුරාබදු තෑගි අරමුදලේ ශුද්ධ වත්කම් ශේෂය ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී රු 42,813,391 ක් හෙවත් සියයට 11.6 කින් පිරිහීමක් නිරීක්ෂණය වු අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ශේෂය රු. 2,129,466 කින් වර්ධනයක්ද නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

<table>
<tr><th>විගණන නිරීක්ෂණය<br>----------------------</th><th>කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම<br>----------------------</th><th>නිර්දේශය<br>-----------</th></tr>
<tr><td>(අ) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 කට අදාලව කාර්මික අපරාධ ග්‍රහණ සම්බන්ධව සුරාබදු දෙපාර්තමේන්තුවේ නිතී ක්‍රියාත්මක කිරීමේ අංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද ග්‍රහණ කිරීම් තොරතුරු අනුව 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වැටලීම් සංඛ්‍යාව වාර්ෂිකව පහත වැටීමක් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි විය.
<table>
<tr><th>වර්ෂය</th><th>වැටලීම් සංඛ්‍යාව</th><th>ඉකුත් වර්ෂයට සාපේක්ෂව අඩු වීම</th><th>අඩු වීමේ ප්‍රතිශතය</th></tr>
<tr><td>2016</td><td>4593</td><td>339</td><td>-</td></tr>
<tr><td>2017</td><td>4315</td><td>278</td><td>6</td></tr>
<tr><td>2018</td><td>3684</td><td>631</td><td>14</td></tr>
<tr><td>2019</td><td>3623</td><td>61</td><td>1.6</td></tr>
<tr><td>2020</td><td>2747</td><td>876</td><td>24</td></tr>
</table></td><td>කාර්මික අපරාධ වැටලීම් අඩුවීමට හේතුව වී ඇත්තේ සුරාබදු නිලධාරීන් විසින් බලපත්‍ර ස්ථාන නිරන්තරයෙන් අධීක්ෂණයට ලක්කර මනා පාලනයකින් යුතුව නිත්‍යානුකූල රාමුව තුල එම ව්‍යාපාර කරගෙන යාම සඳහා බලපත්‍රධාරීන් යොමු කිරීමයි. එම නිසා සුරාබදු බලපත්‍ර ස්ථානවල සිදුවන සුරාබදු බලපත්‍රවල කොන්දේසි කඩකිරීම් වල අඩුවක් දක්නට ඇත. මේ හේතුව නිසා කාර්මික වැටලීම් සංඛ්‍යාව අවම වී ඇත.</td><td>බලපත්‍රලත් ස්ථාන පිලිබඳ අඛණ්ඩව විධිමත් පරීක්ෂාවක් සිදු කිරීම.</td></tr>
<tr><td>(ආ) සමථකරණයෙන් පසු කාර්මික අපරාධ සම්බන්ධයෙන් නිලධාරීන් විසින් දීමනා ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී ඉදිරිපත් කල කාර්මික අපරාධ ග්‍රහණ සංඛ්‍යාව 3749 ක් ලෙස සලකනු ලැබුවද, 2011 අගෝස්තු 11 දිනැති අංක 03/2011 දරන සුරාබදු චක්‍රලේඛ ප්‍රකාරව කාර්මික අපරාධ සම්බන්ධ සමථ මුදල් අයකර ගැනීමේදී ප්‍රධාන ගණයේ කොන්දේසි කඩ කිරීම් සහ සාමාන්‍ය වැරදි දක්වා තිබුණි. ඒ අනුව ඉහත කාර්මික අපරාධ ග්‍රහණ සඳහා ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් වාර්තා පරීක්ෂාවේදී මුළු ග්‍රහණ සංඛ්‍යාවෙන් 2284 ක් හෙවත් සියයට 61 ක් සාමාන්‍ය වැරදි බව හා ප්‍රධාන ගණයේ කොන්දේසි කඩ කිරීම් 1465 ක්</td><td>පෙන්වාදීම නිවැරදිය.</td><td>ඉහළ නිලධාරීන් විසින් අහඹු තෝරාගැනීමක් සිදුකර බලපත්‍රලත් ස්ථාන පරීක්ෂාවට ලක්කිරීමට කටයුතු කිරීම තුලින් අසාමාන්‍ය වැරදි නොමැති බවට තහවුරු කර ගැනීමට කටයුතු කිරීම.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | හෙවත් සියයට 39 ක් වැනි අඩු අගයක් බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) | උතුරු පළාතට අයත් සුරාබදු ස්ථාන 5 ක සහ බස්නාහිර පළාතට අයත් සුරාබදු ස්ථානයක 2019 සහ 2020 වර්ෂවල කාර්මික අපරාධ ග්‍රහණ 141 ක් විගණිත දිනය දක්වා විසඳී නොතිබුණි. | අදාළ ලේඛන පරීක්ෂා කරමින් පවතී. නිශ්චිත පිළිතුරක් ඉදිරියේ දී ලබා දීමට කටයුතු කරන අතර නොවිසඳී ඇති කාර්මික අපරාධ වාර්තා විසඳා අවසන් කිරීමටද කටයුතු යොදා ඇත. | නියමිත කාලයක් තුල විසඳීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | 1994 මාර්තු 4 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනය ක්‍රියාත්මක වී 2020 වර්ෂය වන විට වසර 26 ක් ඉක්මවා තිබුණද දෙපාර්තමේන්තුව විසින් තෑගි මුදල් ගෙවීමේදී විවිධ අක්‍රමිකතාවයන් සිදු වී තිබීම, සහ දෙපාර්තමේන්තුවේ කාර්යභාරයේ පුළුල් වීම, යනාදී කරුණු සැලකිල්ලට ගෙන අංක 818 දරන සුරාබදු නිවේදනය සංශෝධනය කිරීම සඳහා මේ වන තෙක් කටයුතු කර නොතිබුණි. | මේ වන විට 1994 මාර්තු 01 දිනැති අංක 818 දරන සුරාබදු නිවේදනය සංශෝධනය කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතී. | විධිමත් පරිදි සුරාබදු නිවේදනය සංශෝධන කිරීම. |
| (ඉ) | සුරාබදු ත්‍යාග මුදල් ගෙවීම් | | |
| (i) | අංක 818 දරන සුරාබදු නිවේදනය ප්‍රකාරව තෑගි මුදල් ගෙවීම සඳහා අදාල නීතිමය ප්‍රතිපාදන සලසා තිබියදීත් එයට පටහැනිව 2020 මාර්තු 16 දින සිට රට තුල උද්ගත වූ කෝවිඩ් 19 වෛරස් ව්‍යාප්තියත් සමඟ කාර්යාලීය කටයුතු අක්‍රීය තත්ත්වයක තිබීම, මැයි සහ ජූනි මාසවල රාජකාරි සඳහා වාර්තා කිරීම තුනෙන් එකකට සීමා වී තිබීම මත සේවයට වාර්තා කිරීම සීමා වී තිබීම, අරමුදල් සඳහා සමථ ගාස්තු ලැබීම අවම මට්ටමක පැවතිම යනාදි කරුණු හේතුවෙන් සුරාබදු ත්‍යාග අරමුදල ගැටලු සහගත තත්ත්වයක් පවතිද්දි පරිපාලනය පිළිබඳ කාරක සභාව විසින් කාර්යසාධන ක්‍රමවේදයකින් බැහැරව පැමිණීම සහ කාර්ය සාධනය සියයට 100 ක් ලෙස දක්වමින් 2020 වර්ෂයේ මුල් අර්ධය සඳහා ත්‍යාග මුදල් ගෙවීමට අනුමත කර තිබුණි. | රට තුල පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ දී පවා දෙපාර්තමේන්තුවේ කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා සීමිත නිළධාරීන් පිරිසක් පැමිණි අතර අනෙකුත් නිලධාරීන් නිවෙස්වල සිට රාජකාරි කටයුතු කරනු ලැබීය. ඒ අනුව මූලික වැටුපෙන් 75% වෙනුවට 50% තෑගි දීමනා ලෙස ගෙවීම් කර ඇත. | වර්ථමානයේ පවත්නා විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | අරමුදලේ කාරකසභා තීරණ ප්‍රකාරව 2020 මුල් අර්ධ වර්ෂය සඳහා ග්‍රහණ වලට අනියම් ලෙස සම්බන්ධ නිලධාරියෙකුට උපරිම වශයෙන් ගෙවිය යුතු ත්‍යාග දීමනාව මාස 2 ½ ක් වුවද එම සීමාව ඉක්මවා නිලධාරින් 27 දෙනෙකු සඳහා එකතුව රු. 2,012,879 ක මුදලක් ත්‍යාග මුදල් ලෙස වැඩිපුර ගෙවා තිබුණි. එම වැඩිපුර ගෙවා ඇති මුදල් නැවත අයකර ගන්නා ලෙස ලිඛිතව දන්වා තිබුණි. ඒ අනුව නිලධාරීන් 04 දෙනෙකුගෙන් පමණක් රු. 355,000 ක මුදලක් ආපසු අයකර ගෙන තිබුණි. ඉතිරි මුදල් අයකර ගැනීම සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ග විගණනයට වාර්තා නොවුණි. | 818 සුරාබදු නිවේදනය අනුව ගෙවීම් කර ඇති බැවින් අදාළ ගෙවීම් නීත්‍යානුකූල වේ. මෙම නිලධාරීන්ට දීමනා ගෙවා ඇත්තේ අරමුදලේ කාර්යයන් ඉටු කිරීම වෙනුවෙන් වන අතර කොවිඩ් වසංගත කාලයේදී ද කාර්මික අපරාධ වාර්තාවලට අදාළ කාර්යයන් මෙම නිලධාරීන් සිදු කර ඇත. ඒ් අනුව මෙම නිලධාරීන්ට ගෙවා ඇති මුදල් 818 සුරාබදු නිවේදනය අනුව වන අතර නැවත අයකර ගැනීම අවශ්‍ය නොවන බව කාරුණිකව දැනුම් දෙමි. | පවත්නා විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් වෙනුවෙන් වාර්ෂිකව ක්ෂය කරනු ලබන මුදලට සමාන මුදලක් භාණ්ඩාගාරයේ ඇති ක්ෂය සංචිත අරමුදලට බැර කරනු ලබන අතර 2020 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ රු. 56,284,583 ක මුදලක් පැවතුනද එම අරමුදල් ඵලදායී කාර්යන් සඳහා යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් ක්ෂය කර නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණය ක්ෂය සංචිත අරමුදලට බැර වී නොතිබුණි. | එම අරමුදල් උපයෝගි කරගෙන 2021 වර්ෂයේදී දෙපාර්තමේන්තුව සඳහා පරිගණක හා ලී බඩු උපකරණ මිලදී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමිනි පවති. | ක්ෂය සංචිත අරමුදලේ ඵලදායි කාර්යක් සඳහා යොදවා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සුරාබදු තැගි අරමුදලේ පරමාර්ථ ඉටුකිරීමට අදාලව නිලධාරීන්ගේ පුහුණු හා අධ්‍යයන කටයුතු, ප්‍රශංසනීය වැඩ, නිර්භීත ක්‍රියා, විශේෂ රාජකාරී හා විශේෂ වැටලීම් සහ ලී බඩු, කාර්යාල උපකරණ, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම යන කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් රු. මිලියන 39.7 ක් වෙන්කර තිබුණද වර්ෂය තුල එම කාර්යයන් සඳහා කිසිදු වියදමක් දරා නොතිබුණි. | 2020 වර්ෂය තුල එම ප්‍රතිපාදන වලට අදාලව ගෙවීම් කිරීමට කිසිවක් ඉදිරිපත් නොවුණි. | අරමුදලේ පරමාර්ථ ඉටුකිරීමට අයවැය මගින් වෙන්කර ඇති ප්‍රතිපාදන උපයෝජනය කල යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021. පෙබරවාරි 17 දින මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කල අතර නැවත සංශෝධනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 2021. මාර්තු 23 දින ඉදිරිපත් කර ඇත. | සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2021. මාර්තු 23 දින ඉදිරිපත් කර ඇත. | පවත්නා විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අයවැයගත සංඛ්‍යා සහ තත්‍ය සංඛ්‍යා සැසඳීමේදී ආදායම් විෂයන් දෙකක සියයට 18 සිට සියයට 20 දක්වා සහ වියදම් විෂයන් 07 ක සියයට 14 සිට සියයට 100 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කලමණාකරන පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවිය. | ඉදිරියේදී අයවැය ලේඛනය අනුව වියදම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. | අයවැය ලේඛනය ඵලදායි කලමණාකරන පාලන කාරකයක් ලෙස උපයෝගී කල යුතුය. |